ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1819/10 - 2013 ජූලි මස 17 වැනි බදාදා - 2013.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

III වැනි කොටස - ඉඩම්

ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

2013 අංක 232 දරන ආඥාව

මගේ යොමු අංකය : 4-3/4/2013/D/63.

ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: හා/5/4/2/51.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡෙදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 17 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.— ප්‍රදේශීය ලේකම්, හාලිඇල.

ඉඩමේ විස්තරය.— ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ, (82-සී) ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, මයිලගස්තැන්න ගමේ, පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක B/ACQ/HLE/2013/395 හා 2013.05.09 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර A - ඵලදළුව වත්ත - ප්‍රමාණය: හෙක්ටයාර 1.6523**

උතුරට: තැන්නේ කුඹුරේ එදිරිසිංහලාහේ සවුන්දිරිස්, තැන්නේ කුඹුරේ එදිරිසිංහලාහේ චන්ද්‍රාවති, මොහොමඩ් හයිඩ්‍රස් මොහොමඩ් හම්සා යන අය හිමිකම් කියන ඵලදළුව වත්ත සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ;

නැගෙනහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ;

දකුණට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ තැන්නේ කුඹුරේ එදිරිසිංහලාහේ සවුන්දිරිස් හිමිකම් කියන ඵලදළුව වත්ත;

බටහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය), තැන්නේ කුඹුරේ එදිරිසිංහලාහේ සවුන්දිරිස්, තැන්නේ කුඹුරේ එදිරිසිංහලාහේ චන්ද්‍රාවති සහ මොහොමඩ් හයිඩ්‍රස් මොහොමඩ් හම්සා යන අය හිමිකම් කියන ඵලදළුව වත්ත.

08– 99

1A - G 017973 - 340 (2013/07)
මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.